ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I – 2023/2024

**LLU 3303 - රෝම නීතිය**

කාලය : පැය එකයි (01)

දිනය : 2024 ඔක්තෝබර් 24 වේලාව : පෙ.ව. 9.30 - පෙ.ව. 10.30

මුළු ප්‍රශ්න ගණන : දෙකයි (02)

එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. (i). ජස්ටිනියන් විසින් රෝම නීතියට කරන ලද ඉහළම දායකත්වය වූයේ නව නීති හඳුන්වාදීම නොව නීති සංග්‍රහගත කිරීමයි.
රෝම නීතිය සංග්‍රහගත කිරීමෙහිලා ජස්ටිනියන්ගේ දායකත්වය ඇසුරින් ඉහත ප්‍රකාශයෙහි වලංගුභාවය පරීක්ෂා කරන්න.

(ලකුණු 10)

(ii). පහත සඳහන් දෑ කෙරෙහි විශේෂිත අවධානයක් යොමු කරමින් රෝම නීතියේ මූලාශ්‍රයන්හි වැදගත්කම සාකච්ඡා කරන්න.

(අ). සෙනෙට් මණ්ඩල ආඥා

(ආ). ප්‍රයිටර්ගේ ආඥා

උචිත උදාහරණ ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න. (ලකුණු 10)

(10 + 10 = ලකුණු 20)

2. "රෝමානුවන් විසින් අවබෝධ කරගත් පරිදි, තම දරුවන් සම්බන්ධයෙන් පියකු සතු වූ සම්පූර්ණ පාලන බලය ඔවුන්ගේ නීතියට සුවිශේෂ වූ දෙයකි. අනෙකුත් නීති පද්ධතීන්හිද සුවිශාල වූ, ඇතැම් විට අත්තනෝමතික ද වූ බලයක් නිවසේ ප්‍රධානියාට ලබා දී තිබූ නමුත්, බලයේ පරිපූර්ණ භාවය සහ මූලධර්ම අදාල කිරීමෙහි පැවති දෘඪ තාර්කික භාවය කරණකොට ගෙන මේ සම්බන්ධ රෝම නීතිය අද්විතීය වේ."

*H.F. Jolowicz, Roman Foundations of Modern Law, Oxford University press, 1957. P181*

ඉහත ප්‍රකාශය අනුසාරයෙන් පීතෘ බලය ආරම්භ වීම, ගති ලක්ෂණ සහ අවසන් වීම කෙරෙහි අවධානය යොමු කරමින් පීතෘ බලය සම්බන්ධයෙන් වූ රෝම නීති මූලධර්මයන්හි විකාශය විශ්ලේෂණය කරන්න. (ලකුණු 20)

-හිමිකම් ඇවිරිණි-